**මහනුවර මහා නගර සභාව**

**මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත**
**අවමංගල්‍ය ශාලා පාලක සේවය ලබාගැනීම**

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත අවමංගල්‍ය ශාලා පාලක සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.08.14 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| | | |
|---|---|---|
| 1. | තනතුරු සංඛ්‍යාව | : තනතුරු 02 |
| 2. | වයස | : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. |
| 3. | දීමනාව | : දෛනික දීමනාව රු. 1507.66 කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය) |
| 4. | අධ්‍යාපන සුදුසුකම් | : අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය) හැර සමත්වීම;<br>*සහ*<br>සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. |
| 5. | වෘත්තීය සුදුසුකම් | : ක්ෂේත්‍රයට අදාළ වසරක පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ. |
| 6. | තෝරා ගැනීමේ ක්‍රමය | : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.<br>සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන නිලධාරින් පහත කොන්දේසි වලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.<br>1. සෑම දිනකම උදෑසන හා රාත්‍රී වශයෙන් සේවා මුර 2ක් ක්‍රියාත්මක වේ. සේවා අවශ්‍යතාවය මත ලබා දෙනු ලබන ඕනෑම සේවා මුරයක රාජකාරි කිරීමට එකඟ විය යුතු ය.<br>2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතු ය.<br>3. සතියකට එක් දිනක් නිවාඩු දිනයක් සේ සැලකේ.<br>4. සේවා සැපයීමට අදාළ අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර, සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ. |

7. වෙනත් සුදුසුකම :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය. මහනුවර නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවකු විය යුතු ය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

සටහන : මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර , සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ජූලි මස 31 දින.